කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2021

2024 - අගෝස්තු

**BCOME 3025 - ව්‍යවසායකත්වය**

ප්‍රශ්න සංඛ්‍යාව : (හතරයි ) 04 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

අ. ව්‍යවසායකත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් ඇති මිත්‍යා මත ප්‍රායෝගික උදාහරණ සමග පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ. ව්‍යවසායකත්වය සහ රටක සංවර්ධනය අතර ඇති සම්බන්ධතාවය සුදුසු උදාහරණ සමග පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක - 02

අ. යම් පුද්ගලයෙකු ව්‍යවසායකයෙකු වීමට හේතුවන කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. විවිධ ව්‍යවසායකත්ව අවස්ථා වර්ගීකරණය කල හැකි ක්‍රම මොනවාද යන්න සුදුසු උදාහරණ සමග පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ. "ඕනෑම කෙනෙකුට ව්‍යාපාර අදහසක් පැවතිය හැක එනමුත් ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ ඉතාම සුළු පිරිසකි.

ඔබ මෙම ප්‍රකාශය සමග එකහද ? ඔබගේ පිළිතුර ප්‍රායෝගික උදාහරණ සමග පැහැදිලි කරන්න.

(12 ලකුණු)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක - 03

අ. නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදන අතර සම්බන්ධතාවය සුදුසු උදාහරණ සමග කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. ශ්‍රී ලංකාවේ සැබෑ ව්‍යාපාරික ලෝකයේ හොඳින් ස්ථාපිත ආයතනික දැවැන්තයෙකුගේ ව්‍යවසායක දිශානතිය සහ කාර්ය සාධනය සම්බන්ධයෙන් ඔබේ තක්සේරුව කුමක්ද?

(ලකුණු 08)

ඇ. රාජ්‍යයක් ලෙස වර්තමාන ලෝක යුධමය තත්වය හමුවේ ඉන්දියාව සූක්ෂම ලෙස තමන්ගේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්නේ කෙසේද යන්න ව්‍යවසායකත්ව මුහුණුවරකින් සුදුසු උදාහරණ ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක - 04

අ. නිර්මාණශීලිත්වය නවෝත්පාදන සඳහා කොපමණ දුරට වැදගත් වන්නේද යන්න සුදුසු උදාහරණ සමග කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. ආයතනික ව්‍යාපාරකරණය වර්ගීකරණය කල හැකි ආකාරය උදාහරණ සමග පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ. වර්තමාන ශ්‍රීලංකාවේ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග මොනවාද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 25)